**නායයෑම් ආපදා ආරක්ෂා කිරීමේ ව්‍යාපෘතිය - 2018**

---

නායයෑම් ආපදා ආරක්ෂා කිරීමේ ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (ජජාසනි) අතර 2013 මාර්තු 14 දින එළඹි අංක එස්එල්-පී 109 දරන ණය ගිවිසුමේ විධිවිධානයන් සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මධ්‍යම, ඌව හා සබරගමුව පළාත්වල උස්බිම් ප්‍රදේශවල සුදුසු ප්‍රතික්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම මඟින් මූලික යටිතල පහසුකම් ලෙස ජාතික මාර්ග නායයෑම් අවදානම අවම කිරීම හා එමඟින් ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා දායකවීම සහ මාර්ග ජාලයේ ආරක්ෂාව වැඩි කිරීම සහ මාර්ග භාවිතා කරන්නන් හා පදිංචිකරුවන් ඇතුළත් ජනතාවගේ ජීවිත ආරක්ෂා කිරීම ව්‍යාපෘතියේ අරමුණයි. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 16,201.2 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 122.6 ක් වූ අතර ඉන් රු.මිලියන 12,870.45 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 97.4 ක් සැපයීමට ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය එකඟ වී තිබුණි. රුපියල් මිලියන 3,331 ක් වූ ඉතිරි ප්‍රමාණය ශ්‍රී ලංකා රජය මඟින් අරමුදල් සැපයීමට නියමිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2017 මාර්තු 24 දින ආරම්භ කරන ලද අතර 2019 මාර්තු 21 වන විට නිම කිරීමට නියමිතය.

**1.3 තත්ත්වා ගණනය කළ මතය.**

මෙම වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම.**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණනය ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්.**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකරිත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර

අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.
ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
ව්‍යාපෘතිය මඟින් වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණන කාලය තුළදී හඳුනාගනු ලබන අභ්‍යන්තර පාලනයේ වැදගත් අකාර්යක්ෂමතා ඇතුළුව අනෙකුත් කරුණු අතරින් වැදගත් විගණන සොයාගැනීම්, සම්බන්ධ පාර්ශවයන් සමඟ සන්නිවේදනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අදහස් දැක්වීම.

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දින වන විට කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුට ගෙවිය යුතු රු. 300,597 ක් වූ රඳවාගත් මුදල් ගිණුම්වලට ගෙන නොතිබුණි. | කෙරීගෙන යන වැඩ වටිනාකම සහ වගකීම් අඩුවෙන් දැක්වීම. | වැරදි නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලැබේ. | වර්ෂය අවසානයේ ගෙවිය යුතු ශේෂය මූල්‍ය ප්‍රකාශනවලට ගැනීම අවශ්‍ය වේ. |
| (ආ) | කොන්ත්‍රාත්කරුවන් මඟින් ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදනය කරන ලද පරිගණක උපකරණ, කාර්යාලීය උපකරණ සහ විද්‍යුත් උපකරණ වල වටිනාකම සිවිල් වැඩවල පිරිවැයෙන් වෙන්කර වෙනම හඳුනාගෙන නොතිබුණි. | ඉදිකරන ලද හෝ ප්‍රසම්පාදනය කරන ලද දේපළ වල වටිනාකම එකිනෙකට වෙනස් ජීවිත කාලවලින් යුක්ත වන අතර ඒවා භාවිතා කිරීමේ අරමුණු වෙනම පෙන්වා නොතිබුණි. | ව්‍යාපෘතියේ කටයුතු සම්පූර්ණ වූ විට ගැළපීම් කරනු ලැබේ. | වෙනස් ජීවිත කාලවලින් යුත් වත්කම් වෙනම පෙන්නුම් කිරීම අවශ්‍ය වේ. |

## 3. භෞතික කාර්යසාධනය.

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය.

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| ක්‍රියාකාරකම | 2018 දෙසැම්බර් 31 දිනට කාර්යසාධනය | | බලපෑම | කළමනකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| | අපේක්ෂිත ප්‍රතිශතය | ලගාකරගත් ප්‍රතිශතය | | | |
| කොන්ත්‍රාත් පැකේජ I යටතේ ආපදා අවම කිරීමේ ඉදිකිරීම් කටයුතු | 75.5 | 47.1 | නායයෑම් අවදානම් ප්‍රදේශයකි. | වැඩ සම්පූර්ණ කිරීම සඳහා කාලය දිර්ඝ කිරීම් කර තිබේ. | ඇති විය හැකි අවධානම් මඟහරවා ගැනීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය.

| | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය ආරම්භයේ දී හඳුනාගෙන නොතිබු අඹේපුස්ස වැඩබිම සඳහා ප්‍රතික්‍රියාමාර්ග යෙදීම සඳහා රු.මිලියන 243 ක් ඇස්තමේන්තුකර තිබුණි. | ආරම්භක විෂයපථයේ වෙනස් වීම. | හදිසි පාරිසරික හේතූන් මත අදාළ වැඩකටයුතු සිදු කර තිබුණි. | නායයෑමේ අවධානම් ක්‍රමානුකූලව හඳුනා ගෙන කාර්යයට ප්‍රමුඛතාවය දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) ව්‍යාපෘතිය 2019 මාර්තු 30 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණද එකී කාලසීමාව ඉක්මවා කොන්ත්‍රාත් පැකේජය I යටතේ ප්‍රතික්‍රියාමාර්ග අවසන් කිරීම සඳහා කාලය 2019 ඔක්තෝබර් 24 දක්වා ලබාදී තිබුණි. | ශ්‍රී ලංකා රජය සඳහා අමතර පිරිවැයකි. | ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීම ව්‍යාපෘතියේ කොන්දෙසී අනුව විය යුතුය. | ව්‍යාපෘති කාලය තුළදී ප්‍රතික්‍රියාමාර්ග වේගවත් කිරීම අවශ්‍ය වේ. |

**3.3 මතභේදයට තුඩුදෙන කරුණු.**

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) මාර්ග සංවර්ධන අධිකාරියේ කඩුගන්නාව විධායක ඉංජිනේරු කාර්යාලයේ නායයෑම් ආපදා අවම කිරීමට උපාංග ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමට රු.මිලියන 48 ක් ඇස්තමේන්තු කර ඇති අතර එය සම්පූර්ණ කිරීමට රු.මිලියන 127.75 ක් වැයකර තිබුණි. | නුසුදුසු ඇස්තමේන්තු පිළියෙල කිරීම නිසා අමතර පිරිවැයක් දැරීමට සිදුවිය. | නිර්මාණවල වෙනස්වීම් නිසා පිරිවැය වැඩිවීමක් සිදුව තිබේ | වැඩ ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තු පාලනයන් ශක්තිමත් කළ යුතුය. |

**3.4 පද්ධති හා පාලන.**

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) වැඩ නිමකරන ලද මධ්‍යම පළාතේ කොත්මලේගම, සබරගමුව පළාතේ ඉඹුල්පේ සහ ඌව පළාතේ ලුණුගල සහ වල්හපුතැන්න වැඩ බිම් 2018 දෙසැම්බර් 31 දිනට මාර්ග සංවර්ධන අධිකාරියට භාර දී තිබුණද, නායයෑම් ඇති විය හැකි අවධානම් සමාලෝචනය කිරීම සහ අධික්ෂණය කිරීම මෙන්ම සිදුකරන ලද ඉදිකිරීම් කටයුතු නඩත්තු කිරීම සඳහා කිසිදු යාන්ත්‍රාගාරයක් ස්ථාපිත කර නොමැත. | ක්‍රියාත්මක කරන ලද ප්‍රතික්‍රියාමාර්ග යන්හි තිරසාරභාවය පිළිබඳ අවධානම. | මාර්ග සංවර්ධන අධිකාරියේ පළාත් කාර්යමණ්ඩලය විසින් අදාළ ක්‍රියාමාර්ග ගත යුතුය. | ප්‍රතික්‍රියාමාර්ගයන්හි කටයුතු අධික්ෂණය හා සමාලෝචනය සඳහා ශක්තිමක් යාන්ත්‍රනයක් ස්ථාපිත කළ යුතුය. |